## වල් පැලෑටි පාලනය

වගාවේ මුල් සති හය තුළ දී බෝගයේ සම්පූර්ණයෙන් වල් පැලෑටි පාලනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්න.

## කෘමි පාලනය

**බඩඉරිඟු පුරුක් පණුවා**

විශේෂයෙන් යල කන්නයේදී ජූනි, ජූලි සහ අගෝස්තු මාසවල වගා කළවිට මෙම කෘමි හානිය දරුණු විය හැක. දළඹුවා විසින් ලපටි පැලවල අග්‍රස්ථයට හානි කරයි. වැඩුනු ගාකවල කඳ සිදුරු කිරීම නිසා ගසෙහි ඉහළ කොටස මැරී යයි.



## පාලනය

**නිර්දේශිත කෘමිනාශක**

හානිය අධික නම් සිටුවා සති 2-3 කාලයේදී ඩයසිනෝන් 5% කැට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 10-15 ක් පත්‍ර ගොබයට යොදන්න. ඩයසිනෝන් දියර මෙම අවස්ථාවේ ඉසීමට සුදුසු නොවේ.

## අස්වනු නෙලීම

කරල් කෙළවරින් පිටතට විහිදුනු කෙඳි, දුඹුරු සිට කලුපැහැ වීමෙන් පසු, එනම් බීජ පැලවී දින 70-75 කාලයකින් අමු කරල් ලෙස නෙලා ගත හැකිය. පැසුනු කරල් ලෙස අස්වනු නෙලන්නේ නම්, කොළපු හොඳින් වියලී ඇති විට සහ බීජය සැපු විට එය එකවර කැඩී යාම සිදුවන අවස්ථාවේදී (දත් අතරේ නොඇලවෙන විට) හෝ බීජවල පහත කෙළවරෙහි කළු පැහැති ස්ථරයක් පෙන්වන විට අස්වැන්න නෙලා ගත යුතුය.

## අස්වැන්න

නව වැඩි දියුණු කළ ප්‍රභේදවලින් මනා පාලන තත්ත්ව යටතේ හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 5000-6000 පමණ අස්වැන්නක් ලබා ගත හැකිය.

## පසු අස්වනු කටයුතු

නෙලාගත් වියලි කරල් කොළපු සමඟ දින 2-3 ක් අව්වේ වියලා ගන්න. ඉන්පසු කොළපු ඉවත් කර තවදුරටත් වියලා බීජ වෙන්කර ගන්න. කිසිවිටෙක නෙලාගත් කරල් ගොඩගසා නොතිබිය යුතුය. එය වියලි බිමක හොඳින් ඇසිරිය යුතුය. අස්වනු නෙලූ විගස තද අව්වේ බීජ වියලීමද නොකළ යුතුය.

## බීජ නිෂ්පාදනය

විවෘත පරාගනය සහිත ප්‍රභේදවල බීජ නිෂ්පාදනයේදී වගාව සමාන තීරු (කොටස්) වලට බෙදා, එම එක් කොටසක අඩංගුවී ඇති වගාකර ඇති ප්‍රභේදයට ආවේනික ලක්ෂණ පෙන්වන ගස්වලින් 50% ක් විශේෂයෙන් තෝරාගෙන කරල් නෙලා බීජ සකසා ගන්න.


**වැඩි විස්තර සඳහා**

අධ්‍යක්ෂ,
ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
මහඉලුප්පල්ලම.
දුරකථන අංක : 025-2249177, 025-2249132


Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya. Printed by: AGRICULTURE PRESS, Peradeniya.

**අපි වවමු - රට නඟමු**

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# බඩඉරිඟු





කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

## දේශගුණික අවශ්‍යතා

හොඳින් පැතිරී ගිය වර්ෂාපතනයක් පවතින පහතරට වියළි සහ අතරමැදි කලාපවල මහ කන්නයේ මෙම භෝගය සාර්ථකව වගා කළ හැකිය. අතිරේක ජලසම්පාදන පහසුකම් ඇති නම් යල කන්නයේදී ද මෙම භෝගය සාර්ථකව වගා කිරීමට පිළිවන. මීට අමතරව තෙත් කලාපයේ හොඳින් ජලවහනයක් පවතින ඉඩම්වල යල කන්නයේදී අමු කරල් නිෂ්පාදනය සඳහා වගා කළ හැකිය.

## පස

හොඳින් ජලය බැස යන ගැඹුරු පසක් වගාව සඳහා යෝග්‍යවේ. කාබනික ද්‍රව්‍ය අඩංගු රතු දුඹුරු පස වඩාත් සුදුසුය.

## බිම් සැකසීම

සෙ.මී. 15-20 ගැඹුරකට පස පෙරලීමක් කළයුතු වන අතර. සියුම්ව සකසාගත් සමතලා කරගත් බිමක් බීජ සිටුවීම සඳහා අවශ්‍ය වේ.

**නිර්දේශිත ප්‍රභේද**

| ප්‍රභේද | බීජවල පැහැය | අස්වනු නෙලීමට ගතවන කාලය දින | සාමාන්‍ය අස්වැන්න හෙ/ටො |
|---|---|---|---|
| විවෘත පරාගනය | | | |
| වන ප්‍රභේද | | | |
| හදා | තැඹිලි | 105-110 | 4 |
| රුවන් | තැඹිලි | 105-110 | 4 |
| අරුණ | තැඹිලි | 90-100 | 4 |
| මුතු | සුදු | 110-115 | 4 |
| *සම්පත් දෙමුහුම | තැඹිලි | 105-110 | 5-6 |

*සම්පත් දෙමුහුම : අස්වැන්න වැඩියි.
නියඟයට ඔරොත්තු දේ.

## බීජ අවශ්‍යතාවය

බීජ කි.ග්‍රෑ. 15-20 ක් අතර ප්‍රමාණයක් හෙක්ටයාරයක් වගා කිරීම සඳහා අවශ්‍ය වේ. අධික ප්‍රරෝහණයක් සහ දිරියක් සහිත පැළ ලබා ගැනීමට බීජ අස්වනු නෙලූ පසු ඉතා ඉක්මනින් සිටුවීම කල යුතුය. දෙමුහුම් බීජ භාවිතා කරන්නේ නම් හෙක්ටයාරයකට බීජ කි.ගෑ. 12ක් පමණ අවශ්‍ය වේ.

## සිටුවීමේ කාලය

අහස් දියෙන් වගා කරන විටදී සැප්තැම්බර් මස අග භාගයේදී හෝ ඔක්තෝබර් මස මුල් භාගයේදී හෝ බීජ සිටුවීමට නිර්දේශ කරනු ලැබේ. යල කන්නයේ දී මෙම භෝගය වගා කළ යුත්තේ අප්‍රේල් මස මුල් භාගයේදීය. එහෙත් මනා ජල සම්පාදනයක් සහ කෘමි පාලනයක් ලබාදිය හැකි නම් වියළි කලාපයේ අමු කරල් සඳහා හෝ බේබි කෝන් (ළදරු කරල්) සඳහා නියමිත කාලයකින් තොරව වගා කළ හැකිය.

## පරතරය

හෙක්ටයාරයකට පැල 55.000 ක සංඛ්‍යාවක් පවතින සේ බීජ සිටුවන පරතරය පහත දී ඇති අයුරින් පවත්වා ගන්න.

බඩ ඉරිඟු වගාව යාන්ත්‍රිකරණය කිරීමේදී රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධකර රොටරිය සහ බීජ වප්කර මඟින් බිම් සැකසීම සහ බීජ සිටුවීම සිදුකරන බැවින් පේළි අතර පරතරය සෙ.මී. 80 පමණ තිබිය යුතුය. එම නිසා පැළ අතර පරතරය සෙ.මී. 20 - 25 පමණ අඩුකල යුතුය. එමඟින් හෙක්ටයාරයකට පැළ ගහණය 55,000 වන ප්‍රශස්ත අගයේ පවත්වා ගත හැක

| බීජ සිටුවීමේ පරතරය | එක ස්ථානයක ඉතිරි කළයුතු පැළ ගණන |
|---|---|
| සෙ.මී. 60×30 | එකයි |
| සෙ.මී. 60×60 | දෙකයි |

## පොහොර යෙදීම

අවසාන බිම් සැකසීමත් සමඟ භෝගයට අවශ්‍ය පොස්පරස් හා පොටෑෂ් සම්පූර්ණ ප්‍රමාණය හා අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණයෙන් 1/3 ක් හොඳින් මිශ්‍රකර බීජ සිටුවීමට ප්‍රථම පසට යෙදිය යුතුය. කිසියම් අයුරකින් මෙම පොහොර ප්‍රමාණය යෙදීමට නොහැකි වුවහොත්. බීජ සිටුවා දින 10-14 ක් ඇතුලත සමාන අයුරින් බෙදියන සේ සිටුවන ලද පේලි අතරින් මූලික පොහොර ප්‍රමාණය යෙදීමට පියවර ගන්න. ඉතිරි නයිට්‍රජන් පොහොර ප්‍රමාණය සති 4-5 අවස්ථාවල අඟල් 4-5 දුරින් පස තුළට යෙදිය යුතුයි.

**අහස් දියෙන් වගා කරන විට**

| මූලික පොහොර | ප්‍රමාණය (කි.ග්‍රෑ/හෙක්) |
|---|---|
| යූරියා | 75 |
| සාන්ද්‍ර සුපර් පොස්පේට් | 100 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 50 |
| **මතුපිට පොහොර** | |
| යූරියා (සති 4-5 දී) | 140 |

පසෙහි තෙතමනය ප්‍රමාණවත් නොවේ නම් මතුපිට පොහොර යෙදීම ප්‍රමාද කරන්න.

**ජල සම්පාදනයෙන් වගා කරන විට**

| මූලික පොහොර | ප්‍රමාණය (කි.ග්‍රෑ/හෙක්) |
|---|---|
| යූරියා | 75 |
| සාන්ද්‍ර සුපර් පොස්පේට් | 100 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 50 |
| **මතුපිට පොහොර** | |
| යූරියා (සති 4-5 දී) | 250 |

## ජල සම්පාදනය

අධික වර්ෂාව පවතින විටදී වගාව තුළ රැඳී නොපවතින පරිදි ජලය හොඳින් බැස යාමට සැලැස්විය යුතුය. බීජ සිටුවා දින 85-90 ක් ගතවූ පසු ජල සම්පාදනය නතර කළ හැකිය. මල් පිපෙන අවධියේදී ජල හිඟතාවයකට මුහුණපෑම සම්පූර්ණයෙන් වළකාලිය යුතුය.